---

**මතුගම ප්‍රාදේශීය සභාව**

**කළුතර දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 13 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 අගෝස්තු 02 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 ජනවාරි 13 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මතුගම ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැඩසටහන් 01 හි ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තු වියදම ලෙජර් ගිණුම අනුව රු.1,331,393 ක් වුවද රු.133,139 ක් ලෙස ගෙන, ගිණුම තුලනය කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ වියදම රු.1,198,254 ක් අඩුවෙන් දැක්විණි.

(ආ) පුස්තකාල පොත්, හිඟ හිටි වර්පනම් බදු හා වැටුප් ප්‍රතිපූර්ණ ගිණුම්හි ලෙජර් ගිණුම් නිවැරදිව ශේෂ කර නොතිබීම නිසා ශේෂ පිරික්සුමේ හර පැත්තේ එකතුව රු.1,997,649 ක් අඩුවෙන් දැක්විණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථාවර වත්කම් ගිණුම්වල ශේෂය රු.212,096,456 ක් වූ අතර ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමේ ශේෂය රු.207,857,436 ක් විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් මාසයේදී රු.900,000 කට විකුණා තිබූ ජේසීබී යන්ත්‍රයේ පිරිවැය හඳුනාගෙන ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි.

(ඉ) 2012 දෙසැම්බර් 31 දිනට ණයහිමි උපලේඛනයේ දැක්වෙන එකතුව රු.1,244,543 ක් වූ ණයහිමි ශේෂයන් 03 ක් දෙවරක් ගිණුම් ගත වී තිබුණි.

(ඊ) 2012 වර්ෂයේ කර්මාන්ත 3 ක් සඳහා ලැබී තිබූ රු.1,633,686 කට අදාල ප්‍රතිවිරුද්ධ සටහන් හඳුනාගත නොහැකි වූ අතර 2012 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයගැති ශේෂය තුළ එම කර්මාන්ත සඳහා ලැබිය යුතු මුදල සටහන් වී තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේදී ජේසීබී යන්ත්‍රය හා ටිපර් යන්ත්‍ර දෙකක් මිලදී ගැනීමේදී ගෙවා තිබූ රු.3,700,000 ක් හා රු.9,000,000 කට අදාල හර සටහන ගිණුම් ගත කර නොතිබුණි.

(ඌ) කර්මාන්ත ණයහිමි ලෙජර් ගිණුමේ ආරම්භක ශේෂය වූ රු.5,262,022 ක් පමණක් ගිණුම් ගත කර තිබූ අතර ලැබීම්, ගෙවීම් හෝ අවසාන ශේෂය ගිණුම් ගත නොකර ශේෂ පිරික්සුමේ රු.1,953,964 ක් දක්වා තිබුණි. කර්මාන්ත ණයගැති ගිණුමේ ආරම්භක ශේෂය රු.9,284,256 ක් හා අවසාන ශේෂය රු.27,456,517 පමණක ගිණුම් ගත කර ඇති අතර ලැබීම් ගෙවීම් කිසිවක් ගිණුම් ගත කර නොතිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

සමීක්ෂණ මණ්ඩල වාර්තා හා යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛන නොමැතිවීම නිසා එකතුව රු.209,131,760 ක් වූ ස්ථාවර වත්කම් ශේෂ 4 ක්ද, අදාල උපලේඛන නොමැතිවීම නිසා රු.102,574 ක් වූ ආයුර්වේද ගබඩා ශේෂය හා රු.77,345 ක් වූ සේවක ඇප ශේෂය විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1:3:3 අවිනිශ්චිත ගිණුම

2012 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුමේ රු.1,744,331 ක බැර ශේෂයක් විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.8,980,607 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 2,870,388 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000' | රු.000' | රු.000' |
| (i.) වරිපනම් හා බදු | 6,832 | 5,034 | 8,565 |
| (ii.) බදු කුලී | 4,814 | 4,281 | 2,526 |
| (iii.) බලපත්‍ර ගාස්තු | 302 | 301 | 24 |

2:2:2 දැන්වීම් පුවරු ආදායම්

හොරවල ප්‍රදේශයේ සවි කර තිබූ දැන්වීම් පුවරු 4 ක් වෙනුවෙන් 2012 වර්ෂය සඳහා අය විය යුතු රු.50,150 ක් විගණන දිනය වූ 2013 ජනවාරි 20 දින වන විටත් අයවී නොතිබුණි.

2.2.3 හිඟ ගෙවල් කුලී

හොරවල උප කාර්යාල බල ප්‍රදේශයට අයත් ගෙවල් කුලීකරුවන් 2 ක ගෙන් 2007 අගෝස්තු හා සැප්තැම්බර් මාසවල සිට අය නොවී පැවත එන රු.12,239 ක් විය.

2.2.4 බලපත්‍ර ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමත හෝටල්, ආපනශාලා, නවාතැන්පොල ආදායමින් සියයට 1ක් නොඉක්මවන ප්‍රමාණයක් බලපත්‍ර ගාස්තු ලෙස අයකර ගත යුතු බවට විධිවිධාන සළසා ඇතත් සංචාරක මණ්ඩලයෙන් අනුමත කර තිබූ මතුගම තානායමෙන් කිසිදු වර්ෂයක සියයට 1 ක ආදායම් අයකර නොතිබුණි.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 6,565,607 |
| (ii) | මුද්දර ගාස්තු | 3,845,707 |

2.2.6 පරිසර බලපත්‍ර

2007 වසරේ සිට 2012 වසර දක්වා පරිසර බලපත්‍ර අවලංගු වී තිබූ ආයතන 15 සම්බන්ධයෙන් තවදුරටත් එම ආයතන පවත්වාගෙන යන්නේද පිළිබඳ තහවුරු කරගෙන නැවත බලපත්‍ර නිකුත් කිරීමට විගණිත දිනය වූ 2013 පෙබරවාරි 20 දින වන විටත් කටයුතු කර නොතිබුණි.
පරිසර බලපත්‍ර ලබා ගත යුතු වූ ආයතන 46 ක් 2012 වර්ෂයේදී සභාව විසින් හඳුනාගෙන තිබූ අතර ඒ සඳහා බලපත්‍ර ලබා දීමට විගණිත දිනය වූ 2013 පෙබරවාරි 20 වන විටත් කටයුතු කර නොතිබුණි.

2.2.7 ගෙවිය යුතු හා ලැබිය යුතු ගිණුම්

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.20,901,353 ක් වූ වියදම් ණයහිමි ශේෂය තුළ රු.9,608,537 ක ශේෂ හඳුනාගෙන නොතිබුණි.

(ආ) වර්ෂ ගණනාවක සිට ගිණුම් වල දක් තිබුණද එම ශේෂයන් සමාලෝචිත වර්ෂයේදී ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. රු.96,000 ක් වූ ලැබිය යුතු පෞද්ගලික බස් නැවතුම් පල ආදායම් හා ලැබිය යුතු රු.358,225 ක් වූ වීථි පහන් ආධාර අයකරගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

(ඇ) 2009 ජූලි 16 දින සේවය හැර ගොස් ඇති කළමනාකරණ සහකාරවරයෙකුගෙන් එම අවස්ථාවේදී අය විය යුතුව තිබූ රු.90,539 ක ණය ශේෂයක් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.8 කඩකාමර බදු

--------------------

(අ) 2011 අප්‍රේල් මාසයේදී වැඩ අවසන් කර 2011 මැයි මාසයේදී විවෘත කර තිබූ වැලිපැන්න වෙළඳ සංකීර්ණයේ ඇති කඩ 12 න් විගණිත දිනය වූ 2013 පෙබරවාරි 22 දින වන විටත් බදු දී ඇත්තේ අංක 02 දරන කඩ කාමරය පමණි.

(ආ) 2012 වර්ෂයේදී ඉදි කිරීම් අවසන් කර තිබූ ගල්මත්ත වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 12 න් කඩ කාමර 4 ක් බදු ගෙන නොතිබූ බැවින් උපයෝජනයකින් තොරව පැවතුණි.

2:3 නිශ්ක්‍රිය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්

-------------------------------------------------

පහත සදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභා බල ප්‍රදේශයේ මාර්ග වලට ඇතිරීම සඳහා අවශ්‍ය වන කොන්ක්‍රීට් ගල් නිෂ්පාදනය කිරීම සඳහා 2010 මාර්තු 05 දින හෝමාගම නිව් මැරීන් ටෙක් ආයතනයෙන් රු.130,862 වැය කර මිලදී ගෙන තිබූ යන්ත්‍රය විගණිත දිනය වූ 2013 පෙබරවාරි 22 වන විටත් නිෂ්පාදන කටයුතු ආරම්භ නොකර වැඩ අංගනයේ තිබෙනු ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ආ) වන උද්‍යාන සංවර්ධනය කිරීම සඳහා 2007 අගෝස්තු 23 දින රු.15,000 ක මුදලකට ඇඳි සහිත ගල් බංකු 10 ක් මිලදී ගෙන තිබූ නමුත් 2013 පෙබරවාරි 22 දින විගණන පරීක්ෂාවේදී බංකු 5 ක් කාර්යාලයීය භූමියේ තිබූ අතර ඉතිරි බංකු 5 පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවිණි.

2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත සදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 203 හා 217 ජේදය ප්‍රකාරව සභාවේ සම්පූර්ණ දේපල සම්බන්ධයෙන් පූර්ණ සමීක්ෂණයක් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

---

(ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව පරිගනක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

(ඇ) අනවසර ඉදි කිරීම් සම්බන්ධයෙන් ලැබෙන්නාවූ පැමිණිලි සහ නිලධාරීන් විසින් හඳුනාගන්නා අනවසර ඉදි කිරීම් වාර්තා කිරීම සඳහා ලේඛනයක් පවත්වා නොතිබූ බැවින් හඳුනාගත් සහ වාර්තා වූ අනවසර ඉදි කිරීම් මොනවාද සහ ඒවා සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග මොනවාද යන්න හඳුනාගත නොහැකි විය.

(ඈ) මතුගම මහජන පුස්තකාලයෙන් 2011 සිට බැහැර ගෙන ගොස් ආපසු භාර දී නොතිබූ රු.19,830 ක් වටිනාකමට වූ පොත් 87 ක් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) වාර්ෂික අයවැය ඇස්තමේන්තු සමඟ වර්ෂයේ ඉටුකිරීමට අපේක්ෂිත කාර්යයන් සඳහන් කර තිබූ නමුත් එක් එක් කාර්යයන්ගේ මූල්‍යමය වටිනාකම හා ඉටුකරනු ලබන කාලපරාසයන් ඇතුළත් කර නොතිබූ අතර වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ඊ) වැලිපැන්න උප කාර්යාලය විසින් සබරගමුව සංවර්ධන බැංකුවේ පවත්වාගෙන යනු ලබන ඉතිරි කිරීමේ ගිණුමට හා හොරවල උප කාර්යාලය විසින් මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමට එම උප කාර්යාලවල ආදායම් දිනපතා තැන්පත් කරනු ලබන නමුත් එම බැංකු විසින් එම මුදල් මාස 1 සිට මාස 3 කට වරක් ප්‍රධාන කාර්යාලයීය ජංගම ගිණුමට මාරු කරනු ලබන බව නිරීක්ෂණය විය. මේ අනුව අවම මුදල් ප්‍රමාණයක් ගිණුමේ රැඳෙන පරිදි මුදල් මාරු කිරීමට උපදෙස් ලබා නොදීම නිසා සැළකිය යුතු මුදල් ශේෂයක් කිසිදු උපයෝජනයකින් තොරව පවතින බව එම බැංකු ගිණුම පරීක්ෂා කිරීමේදී අනාවරණය විය.

2.5 ඉඩම් වෙන්දේසි කිරීම

---

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය අනුව සභා බල ප්‍රදේශයේ ඉඩම් වෙන්දේසි කිරීමේදී වෙන්දේසි කරනු ලබන ඉඩම්වල විකුණුම් මිලෙන් 1% ක ආදායමක් සභාව විසින් ලබා ගත යුතු වුවත් එසේ සිදු නොකර සභාවේ ආදායම් පරිපාලක විසින් සකස් කර තිබූ දල ඇස්තමේන්තුවෙන් 1% ක මුදලක් වශයෙන් රු.2,398,500 ක් ඉඩම් 9 කින් ලබා ගෙන තිබූ අතර දල ඇස්තමේන්තුව හා වෙළඳපල විකුණුම් වටිනාකම අතර වෙනස ගලපා ඉතිරි මුදල් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1986 අගෝස්තු 10 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ 1 කොටසේ (i) ඡේදයේ 22(1) ප්‍රකාරව අනුබෙදීමට අදහස් කරන ඉඩම හෙක්ටයාර් 1 ට වැඩි වන විට වීථි සඳහා වෙන් කිරීමෙන් පසු විකුණු ඉඩමේ ප්‍රමාණයෙන් 10% ක ප්‍රමාණයක් පොදු පහසුකම් සඳහා වෙන් කර එය සභාවට පවරා ගත යුතු වුවත් වෙන්දේසි

ඉඩම් හතකින් පොදු පහසුකම් සඳහා වෙන් කර තිබූ ඉඩම්වල ඔප්පු පවරාගෙන ඇති බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඇ) පොදු පහසුකම් සඳහා සභාවට ලැබී තිබූ එම බිම් කොටස්වල මායිම් වෙන් කර නොතිබූ අතර විගණන දිනය වූ 2013 පෙබරවාරි 20 වන විටත් කිසිදු පොදු පහසුකමක් සඳහා ප්‍රයෝජනයක් නොගෙන සංවර්ධනය කිරීමකින් තොරව තිබූ බැව් නිරීක්ෂණය විය.

2.6 විදුලි උපකරණ

-----------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) විදුලි භාණ්ඩ හා උපකරණ මිලදී ගැනීමේදී ගබඩා අවශ්‍යතාවයන් පිළිබඳ ගබඩා භාර නිලධාරීගේ ඉල්ලීම් හා එම අවශ්‍යතාවය පිළිබඳ නිර්දේශ කිරීම් ලේඛණගත කර නොතිබුණි.

(ආ) තොග ලෙජරය පරීක්ෂා කිරීමේදී තොග ශේෂයන් ප්‍රමාණවත්ව නොතිබියදී නිකුත් කිරීම් සිදු කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය.

(ඇ) එක් එක් දිනයේ විදුලි උපකරණ සවි කරන විදුලි කණු අංකය අනුව අවශ්‍ය විදුලි උපකරණ ප්‍රමාණය නිකුත් නොකර වරකට අයිතම 25, 30 බැගින් නිකුත් කර තිබූ අතර ඉතිරි භාණ්ඩ භාරදීමක් සිදු වී නොතිබුණි.

(ඈ) 2013 පෙබරවාරි 20 දින ගබඩා නිලධාරී සමඟ විදුලි භාණ්ඩ අයිතම් 11 ක නියැදියක් භෞතිකව පරීක්ෂා කිරීමේදී තොග ලේඛනයේ සඳහන් ශේෂයන් හා භෞතික ශේෂයන් අතර තොග වර්ග 4 ක ඒකක 96 ක ඌනතාවයක් ද, තොග වර්ග 4 ක ඒකක 507 ක හා වයර් රෝල් මීටර් 5.3 ක අතිරික්තයක්ද විය.

(ඉ) සභා බල ප්‍රදේශයේ සවි කර තිබූ විදුලි කණු අංක කර නොතිබුණි.

2.7 සුසාන භූමි

---------------

සභා බල ප්‍රදේශයේ දළ වශයෙන් හඳුනාගත් සුසානභූමි සංඛ්‍යාව 56 ක් පමණ බව අනාවරණය වූ අතර ඒ සම්බන්ධයෙන් වූ නිරීක්ෂණයන් පහත දැක්වේ.

(අ) සභා බල ප්‍රදේශයේ සභාවට අයත් සුසාන භූමි සංඛ්‍යාව කොපමණද යන්න නිවැරදිව හඳුනාගැනීමට සමීක්ෂණයක් කිරීමට විගණිත දිනය වූ 2013 මාර්තු 22 දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) දැනට හඳුනාගෙන ඇති සුසාන භූමිවල නාමය ලේඛනයක සටහන් කර තිබුණද ඉඩමේ නාමය පිහිටි ප්‍රදේශයේ විස්තර හා ප්‍රමාණය සඳහන් කර නොතිබුණි.

---

(ඇ) සුසාන භූමිවල ආරක්ෂාව හා නඩත්තු කිරීම් සම්බන්ධව තොරතුරු පවත්වා නොතිබුණි.

2.8 කොන්ත්‍රාත්පාලනය

-----------------------------

මග නැගුම ව්‍යාපෘතිය යටතේ ආරම්භ කර තිබූ පොල්ගහවත්ත සෙන්දනායක මාවත ප්‍රතිසංස්කරණය කිරීමේ I අදියරේදී කුට්ටිගල් ඇතිරීම සඳහා 2012 ජුනි 01 දින ඉද්දගොඩ බටහිර නැගෙනහිර ඒකාබද්ධ ගොවි සංවිධානය සමඟ රු.500,000 ක ගිවිසුම්ගත මුදලක් සඳහා ගිවිසුම් අත්සන් කර තිබුණි. ව්‍යාපෘතියේ දිග අඩි 343 ක් , පළල අඩි 8 ක් හා උස අඟල් 6 ක් විය.

සභාවේ තාක්ෂණ නිලධාරී සමඟ 2013 පෙබරවාරි 22 දින සිදු කළ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මාර්ගය සඳහා අතුරන ලද කුට්ටි ගල් වල සම්පීඩන ශක්තිය ඇති බව පරීක්ෂණ වාර්තාව මගින් සනාථ කර තිබුණද අතුරා තිබූ කුට්ටි ගල්වල තැනින් තැන පළුදු වී තිබුණි.

(ආ) ඇස්තමේන්තුවේ වැඩ විෂයය 4 ප්‍රකාරව අඟල් 6 ක් උසට 1:2:4 (3/4) මිශ්‍රණයෙන් ගැටි බැමි බැඳීම සිදු කළ යුතු වුවද මාර්ගය ආරම්භයේ දකුණු පස ගැටි බැම්මේ උස අඟල් 3 1/2 ක් විය.

2.9 අයවැය පාලනය

------------------

(අ) වියදම් විෂයයන් 4 ක සියයට 12 සිට සියයට 86 දක්වා පරාසයක් තුළ වාසිදායක විචලනයක් අනාවරණය වූ අතර ආදායම් විෂයයන් 5 ක සියයට 26 සිට සියයට 93 දක්වා පරාසයක් තුළ අවාසිදායක විචලනයක් අනාවරණය විය. මේ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන තිබූ බවක් නිරීක්ෂණය නොවීය.

(ආ) 2012 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව අනුව වැය විෂයයන් 42 ක් සඳහා එකතුව රු.16,847,000 ක් වූ මුදල් වෙන් කර තිබූ නමුත් 2012 දෙසැම්බර් 31 දිනට ඉන් කිසිදු මුදලක් වියදම් වී නොතිබුණි.

2.10 අභ්‍යන්තර විගණනය

------------------------

පළාත් පාලන කොමසාරිස්ගේ 2008 අගෝස්තු 19 දිනැති අංක WP/LPD/10/2008 දරන ලිපියේ (ඇ) ඡේදය හා ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 අනුව පවත්වාගෙන යා යුතු අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි.

3. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) තොග පාලනය

(ඉ) අයවැයකරණය